“ගැත්තා තම පරමාධිපතිට වඩාත් සමීපයෙන් සිටිනුයේ ඔහු සුජූද් කරමින් සිටියදීය. එහෙයින් (සුජූද් හි) නුඹලා අධික ලෙස ප්රාර්ථනා කරන්න.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව
අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “ගැත්තා තම පරමාධිපතිට වඩාත් සමීපයෙන් සිටිනුයේ ඔහු සුජූද් කරමින් සිටියදීය. එහෙයින් (සුජූද්
හි) නුඹලා අධික ලෙස ප්රාර්ථනා කරන්න.” [صحيح] [رواه مسلم]

ගැත්තා තම පරමාධිපතිට වඩාත් සමීපයෙන් සිටිනුයේ ඔහු සුජූද් කරමින් සිටින තත්ත්වයේය යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ. ඊට හේතුව සැබැවින්ම සලාත් ඉටු කරන්නා ඔහු සුජූද්හි සිටිය දී සර්වබලධාරී අල්ලාහ්ට යටහත් පහත්ව නිහතමානීව තම ශරීරයේ උසස් හා ඉහළම අවයව මහපොළොව මත තබමින් සලාත් ඉටු කරන බැවිනි. සුජූද්හි අධික ලෙස ප්රාර්ථනා කරන මෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ නියෝග කළහ. එම යටහත්භාවය තුළ වචනයෙන් හා ක්රියාවෙන් ඒකාබද්ධ වී ඇති බැවිනි.

http://sunnah.global/hadeeth/si/show/5382